## 25
# සිංහල සාහිත්‍ය ඉතිහාසය

සිංහල රාජධානි මුල් කොට ගෙන සාහිත්‍ය යුග වශයෙන් බෙදා දැක්වීම සාහිත්‍ය ඉතිහාසය දැක්වීමේ එක් සම්ප්‍රදායකි. ඒ අනුව සිංහල සාහිත්‍ය ඉතිහාසයේ යුග කිහිපයකි.

එනම්:-

i. අනුරාධපුර යුගය
ii. පොළොන්නරු යුගය
iii. දඹදෙණි යුගය
iv. කුරුණෑගල යුගය
v. ගම්පොළ යුගය
vi. කෝට්ටේ යුගය
vii. සීතාවක යුගය
viii. මහනුවර යුගය යනුවෙනි.

දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගයේ අවසානය තෙක් සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මෙහි දැක්වේ.

## දඹදෙණි සාහිත්‍ය යුගය

දඹදෙණි රාජධානිය ආරම්භ කරන ලද්දේ තුන්වන විජයබාහු (ක්‍රි.ව. 1232-1236) රජු විසිනි. ඉන් පසු ඔහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු (ක්‍රි.ව.1236-1270) රාජ්‍යත්වයට පත් විය. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු යන නාමයෙන් හැඳින්වුණු මේ රජතුමාගේ කාලය සිංහල සාහිත්‍යයේ විශිෂ්ට දියුණුවක් ඇති වූ යුගයක් විය. අනතුරු ව රජකමට පත් වූයේ සිව්වන විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1271-1272) යි.

දඹදෙණි යුගයේ දී ග්‍රන්ථකරණයෙහි යෙදුණු විශිෂ්ට ලේඛකයන් අතර සංඝරක්ඛිත මාහිමි, දිඹුලාගල මේධංකර මාහිමි, අනවමදර්ශී මාහිමි, ධර්මසේන හිමි හා මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි යන යතිවරු ද දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා ද වූහ.

අඩසියවසක් පමණ වූ කාලය තුළ ලියැවුණු විවිධ විෂයක ග්‍රන්ථ සමූහය දඹදෙණි යුගයට අයත් වේ. ඒවා අතර ධර්ම ග්‍රන්ථ හා අර්ථ ව්‍යාඛ්‍යාන, ව්‍යාකරණ හා කෝෂ ග්‍රන්ථ මෙන් ම ඡන්දස් හා අලංකාර ග්‍රන්ථ ද දක්නට ලැබේ.

## 1. ධර්ම ග්‍රන්ථ

### සද්ධර්ම රත්නාවලිය

මෙය ධර්මසේන හිමියන්ගේ කෘතියකි. පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරු කරගෙන රචිත මේ කෘතියේ කථා වස්තු තුන්සියයක් පමණ ඇතුළත් වේ. ඊට අමතර ව මිලින්ද ප්‍රශ්නය, දීඝනිකායට්ඨකථා, සුත්තනිපාතට්ඨ කථා, බුද්ධවංශ පාලි හා අට්ඨ කථා, මංගල සුත්තට්ඨ කථා යන කෘතිවලින් තෝරාගත් කථා පුවත් ද මූලාශ්‍රය කරගෙන ඇත. මුල් පාලි කථා කෙළින් ම සිංහලයට පරිවර්තනය නොකොට කථා සාරය පමණක් ගෙන සද්ධර්මරත්නාවලිය රචනා කොට ඇති බව ග්‍රන්ථාරම්භයෙහි කතුවරයා දක්වන 'පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි' යන පාඨයෙන් පැහැදිලි වේ.

වර්ණනය සඳහා තමන් තෝරාගත් කථා වස්තුවල චරිත, අවස්ථා හා පරිසර වර්ණනා මැනවින් ගළපා රසවත් ව කථා ඉදිරිපත් කිරීමට සද්ධර්ම රත්නාවලී කතුවරයා සමත් වී ඇත. පොදු ජනවහරින් ගත් උපමා හා පිරුළු බෙහෙවින් භාවිතය මෙහි භාෂා ශෛලියේ කැපී පෙනෙන ලක්ෂණයකි. සද්ධර්මරත්නාවලී කතුවරයා උපහාසය ජනිත කරමින් කථා කීමෙහි සමතකු වූ බවට නිදර්ශන බොහෝ ය.

'නියං සායේ හඬන ආසක් මෙන්
පය බරවායට පිටිකර බෙහෙත් බඳනා සේ
පොල් ගසින් තල් පත් පතන්නා සේ
දත් නැත්තවුන් කියන ගී සේ'

ආදිය ඉන් සමහරකි. පොදු ජනවහරින් ගත් උපමා හා පිරුළු බෙහෙවින් ඇත.

### පූජාවලිය

මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියෝ පූජාවලී නම් ග්‍රන්ථයෙහි කතුවරයාණෝ ය. නවඅරහාදි බුදුගුණවලින් එකක් වූ 'අරහං' යන බුදුගුණය මුල් කරගෙන මේ කෘතිය ලියා ඇත. දේවප්‍රතිරාජ ඇමතිතුමාගේ ආරාධනයෙන් මේ ග්‍රන්ථය ලියන ලද බව ග්‍රන්ථාවසානයෙහි දක්වේ. මේ ග්‍රන්ථය ලිවීමේ පරමාර්ථය වූයේ දෙවන පැරකුම්බා රජු බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම සඳහා උනන්දු කරවීමත්, සත්පුරුෂ ජනයා ශ්‍රද්ධා බුද්ධි වර්ධනය සඳහා උනන්දු කරවීමත් ය.

පූජාවලිය පරිච්ඡේද සූතිස (34) කින් සමන්විත වේ. බුදුගුණ වර්ණනාවකින් මේ කෘතිය ආරම්භ වේ. අනතුරු ව සුමේධ තාපස අවස්ථාවේ නියත විවරණ ලැබීමේ සිට තොරතුරු හා විවිධ කථා ඉදිරිපත් කෙරේ. ඉන් අනතුරු ව බුද්ධ චරිතය හා සම්බන්ධ විවිධ සිදුවීම් හා චරිත විස්තර වෙයි. එහි 33 වන හා 34 වන පරිච්ඡේදවලින් ශාසන ඉතිහාසය විස්තර වේ.

පූජාවලියෙහි කථා වස්තු වර්ණනයේ දී මිශ්‍ර සිංහල බස් වහර උපයෝගී කරගෙන ඇත. යෝගාර්ණවය හා ප්‍රයෝගරත්නාවලිය යන වෛද්‍ය ග්‍රන්ථ ද, මයූරපාද හිමියන් විසින් ලියැවිණි.